කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2016/2017

**INR 3157: ජාත්‍යන්තර දේශපාලන ආර්ථිකය**

කාලය: පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. ජාත්‍යන්තර දේශපාලන ආර්ථිකය යන්න නිර්වචනය කොට එහි වර්ධනය සඳහා දායක වූ සුවිශේෂී අවස්ථා දෙකක් (02) පිළිබඳ විස්තර කරන්න.

2. "තීරුබදු සහ තීරුබදු නොවන බාධා මගින් වෙළඳපල ආර්ථිකයෙහි ක්‍රියාකාරීත්වයට බාධා එල්ල වන නමුත් සමකාලීන ගෝලීය ආර්ථිකය සම්පූර්ණයෙන්ම නිදහස් වෙළඳාමෙන් ක්‍රියාත්මක නොවේ." අදහස් දක්වන්න.

3. ගැට් සම්මුතිය (GATT) යටතේ පහත සඳහන් මාතෘකාවලින් දෙකක් (02) තෝරා ගනිමින් ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන වර්ධනයන් හඳුනා ගන්න.
   i. වෙළඳාම ප්‍රසාරණය කිරීමේ පනත (The Trade Expansion Act) සහ කෙනඩි සාකච්ඡා වටය (Kennedy Round) 1960 සිට 1970
   ii. 1974, 1979 වෙළඳ පනත් (The Trade Acts of 1974, 1979) සහ ටෝකියෝ සාකච්ඡා වටය (Tokyo Round) 1970 සිට 1980
   iii. ඒකාබද්ධ වෙළඳාම (The Omnibus trade) හා තරඟකාරීත්ව පනත (Competitiveness Act) සහ උරුගුවේ සාකච්ඡා වටය (Uruguay Round) 1980 සිට 1990

4. කොටස් දෙකටම (02) පිළිතුරු සපයන්න.
   i. විසිඑක්වන ශතවර්ෂයෙහි ඉස්මතු වන ඒකපාර්ශවීය (unilateral) සහ කලාපීය වෙළඳ ප්‍රතිපත්ති (regional trade policies) පිළිබඳ විවේචනාත්මකව විභාග කරන්න.
   ii. වර්තමාන ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියෙහි ප්‍රධාන ලක්ෂණ හඳුනා ගන්න.

5. කොටස් දෙකටම (02) පිළිතුරු සපයන්න.
   i. අනාගතයේදී ගෝලීය ආර්ථිකයේ වෙනස්කම් සිදුකළ හැකි ප්‍රධාන කරුණු මොනවාද?
   ii. සංවර්ධනය වන රාජ්‍යයන්හි ඇති බහුජාතික සමාගම්වල සීමා හා අපේක්ෂා පැහැදිලි කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතරින් තුනක් (03) පිළිබඳ කෙටි සටහන් ලියන්න
   i. උපායශීලී වෙළඳ න්‍යාය (Strategic Trade Theory)
   ii. වාණිජවාදයේ ප්‍රධාන ලක්ෂණ (Key Principles of Mercantilism)
   iii. ආරක්ෂණවාදය (Protectionism)
   iv. අන්තර්පරායත්තතාවය (Interdependence)
   v. ගැට් සම්මුතියෙහි දෝහා සාකච්ඡා වටය (The Doha round of GATT)